# 19. යහපත් සමාරිතයා

1 වන ජවනිකාව

කතානායක

මේ හිමිදිරි පාන්දර, තවමත් හොඳට එළිය වැටිලා නැහැ. පාරේ මිනිස්සුත් පේන්න නැහැ. ජෙරුසලමේ ඉඳලා මේ මිනිසා යන්නේ ජෙරිකෝවට.

| | | |
|---|---|---|
| මිනිසා | : | ඉක්මන් කරලා ගියොත් දවල් වෙන්න කලින් මට ජෙරිකෝවට යන්න පුළුවන්.<br>(මිනිසා එන දෙස සොරු කණ්ඩායමක් සැඟවී බලා සිටිති) |
| 1 වන සොරා | : | ළඟට ම ආවාම පැනලා අල්ලා ගමු. |
| 2 වන සොරා | : | මම සල්ලියි බඩුයි අරන් යන්නම්, ඔබ ඉතිරි හරිය බලාගන්න. |
| 1 වන සොරා | : | හොඳයි, හොඳයි. |
| මිනිසා | : | අනේ ! අනේ !! මාව බේරා ගන්න.<br>අනේ ! මාව බේරා ගන්න.<br>(පාර අද්දර වැටී සිටිමින් කෙඳිරි ගායි) |

කතානායක : මේ පාරෙන් ආවා පූජකතුමෙක්. ඉක්මන් ගමනින් ආව මේ පූජකතුමා පාරේ වැටී සිටි මිනිසා දැකලා, අනෙක් පැත්තෙන් යන්න ගියා.

පූජකයා : හා ! කවුද ගහලා දමලා ගිහිං වගේ ඒත්, මට පරක්කු වෙනවා. සෙනග මං එනකම් මග බලන් ඇති.



කතානායක : වැටුණු මිනිසා වේදනාවෙන් කෑ ගසද්දී කවුද දැන් එතනට එන්නේ.
දේව මාලිගාවේ වැඩ කරන ලෙවී කෙනෙක් වගෙයි.

ලෙවීයා : ආ ! කවුද මේ කෑගහන්නේ හොඳට ම ලේ ගලනවා.

අනේ ! මට වැඩ තියෙනවා මම යනවා.



කතානායක : බලන්න තුවාල වූ මිනිහාට උදවු වෙන්න කවුරුත් ඉදිරිපත් වුණේ නැහැ. ඒ මිනිසා වේදනාවෙන් කෑගහනවා.

කතානායක : කවුදෝ කොටළුවෙක් පිට නැගිලා මේ එන්නේ හරියට දුර ගමනක් යන කෙනෙක් වගෙයි. පේන විදියෙන් නම් සමාරිතයෙක් වගෙයි.

සමාරිතයා : (කොටළුවා පිටින් බැස වැටුණු මිනිසා වෙත යයි)

මේ මොන අපරාධයක් ද? මේ මිනිසාට කවුදෝ ගහලා දමලා ගිහිල්ලා.

කතානායක : මේ කරුණාවන්ත මිනිසා, වැටිලා ඉන්න මිනිසා දැකලා, කොටළුවාගේ පිටෙන් බැහැලා ඔහු වෙතට ගියා. තුවාලවලට තෙල් හා මිදි යුෂ ගල්වා තුවාල බැන්දා. තමාගේ ම සතා පිට හිඳුවා ගෙන මේ අසරණ මිනිසා ව තානායමකට ගෙන ගියා.



## 2 වන ජවනිකාව

සමාරිතයා : මහත්මයා, මොහු පාරේ වැටිලා හිටියා. මොහු ව තුවාල කරලා දමලා ගිහිං මොහු ව හොඳින් බලා ගන්න. මෙන්න මුදල්. මීට වඩා යමක් වියදම් වුණොත් මා ආයෙත් ආවා ම ගෙවන්නම්.

තානායම්කරු : ඔබ ඒ ගැන බය වෙන්න එපා මම හොඳින් ඔහුව බලාගන්නම්. ඔබ කළේ ඉතාමත් හොඳ දෙයක්.

කතානායක : යහපත් සමාරිතයා සතුටින් පිටවෙලා ගියා.

## පැවරුම්

1. යහපත් සමාරිතයාගේ කතාවට සවන් දීමෙන් පසුව එය රඟ පාන්න.

2. අපතේ යන ද්‍රව්‍ය යොදා (පෙට්ටි, රෙදි කැබලි යනාදිය) එම කතාවේ විවිධ කොටස් මතු වන සේ චිත්‍රයක් ගොඩ නගා පන්ති කාමරයේ එල්ලන්න.

3. පහත ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

    i කතාවේ සඳහන් මිනිසා යමින් සිටියේ කුමන නගරයටද?

    ii ඔහුට සිදු වූයේ කුමක් ද?

    iii ඔහුට උදවු කළේ කවු ද?